# ජොහාන් හෙයින්රිච් පෙස්ටලොසිගේ අධ්‍යාපන දර්ශනය

**එච්.ජී.සී. සම්පත් ගමගේ**

## හැඳින්වීම

1746 ජනවාරි 12 වන දින ස්විස්ටර්ලන්තයේ සූරිච් නගරයේ දී උපත ලද ජොහාන් හෙයින්රිච් පෙස්ටලොසි (Johann Heinrich Pestalozzi, 1746-1827) මධ්‍යම පාන්තික පවුල් පසුබිමක හැදී වැඩුණු දරුවෙකි. ඔහුගේ ළමා කාලය ආර්ථික දුෂ්කරතාවලින් හෙබි එකකි (Mesquida et al, 2017). දරිද්‍රතාව හා සමාජ විෂමතා පිළිබඳ ඔහුගේ මුල් කාලීන අත්දැකීම් පසුකාලීනව අධ්‍යාපන හා සමාජ ප්‍රතිසංස්කරණය පිළිබඳ ඔහුගේ අදහස්වලට පාදක වන්නට ඇතැයි සැලකෙයි. පෙස්ටලොසි ස්විස්ටර්ලන්ත අධ්‍යාපනඥයකු හා අධ්‍යාපන ප්‍රතිසංස්කරණවාදියකු ලෙස සැලකෙයි. දහඅට වැනි සියවසෙහි අග භාගයේ හා දහනව වැනි සියවසේ මුල් භාගයේ දී අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි විප්ලවීය වෙනසක් ඇති කිරීමෙහි ලා ප්‍රධාන භූමිකාවක් ඉටු කළ චින්තකයෙකි. ඇතැමෙක් ඔහු නූතන අධ්‍යාපනයේ පියා ලෙස ද හඳුන්වති (Nair, 2022). අධ්‍යාපනය පිළිබඳ ඔහුගේ නව අදහස් මෙන් ම ඉගෙනීම හා ඉගැන්වීම පිළිබඳ ඉදිරිපත් කළ ප්‍රගතිශීලි ප්‍රවේශ අධ්‍යාපන ක්ෂේත්‍රයට දිගු කාලීන බලපෑමක් ඇති කිරීමට සමත් වී ඇත. පෙස්ටලොසිගේ අධ්‍යාපන දර්ශනය, බුද්ධිය සමග සදාචාරාත්මක හා ප්‍රායෝගික අධ්‍යාපනය ඒකාබද්ධ කරන්නකි. දරුවන්ගේ පරිපූර්ණ සංවර්ධනය අවධාරණය කරන්නකි. ඔහු විසින් හඳුන්වා දුන් ළමා කේන්ද්‍රීය අධ්‍යාපන සංකල්පය හා ක්‍රියාකාරකම් පාදක අධ්‍යාපනය, සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමවල පරිවර්තනයක් ඇති කිරීමට සමත් විය (Bredekamp, 2014). අධ්‍යාපනය පිළිබඳ ඔහුගේ දාර්ශනික අදහස් වර්තමාන අධ්‍යාපන පද්ධති හා බද්ධ කර ගත හැකි ය.

**පෙස්ටලොසිගේ අධ්‍යාපන දර්ශනයට පදනම් වූ කරුණු**

අධ්‍යාපනය පිළිබඳ වර්තමානයේ පවතින බොහෝ සංකල්ප හා මතවාද සංවර්ධනය වී ඇත්තේ දාර්ශනික චින්තාවන්ගේ ආභාසයෙනි (චන්ද්‍රසේකර, 2009). ඔහු උපන් යූරෝපීය ලෝකය හොඳ ම අධ්‍යාපනයක් පවතින රටවල් සඳහා ප්‍රසිද්ධියක් ඉසිළුව ද පෙස්ටලොසි එවකට එහි පැවති අධ්‍යාපන ක්‍රමය පිළිබඳ එතරම් කැමැත්තක් දැක්වුයේ නැත (Mesquida et al, 2017). මතක තබා ගැනීම කෙරෙහි කේන්ද්‍ර ගත වූ ඉගෙනුම් ක්‍රමවේදයක් ඔහුගේ ළමා කාලය තුළ අත්දැක තිබූ බැවින් ගුරුවරයා බලධාරියා ලෙස හැසිරෙන, සිසුන්ට නිදහසේ සිතීමට, ක්‍රියා කිරීමට හා ඉගෙන ගැනීමට අවකාශයක් නො වන පන්ති කාමර සංකල්පය පෙස්ටලොසි බැහැර කළේ ය. අධ්‍යාපනයට ඔහුගේ ඇති සැබෑ ම ආශාව මතු වූයේ සූරිච් විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබමින් සිටිය දී ය. ඔහු නීතිය, දේශපාලනය හා දර්ශනය හැදෑරූ අතර තරුණ සමාජ ක්‍රියාකාරීයෙක් ලෙස ප්‍රචලිත විය (Nair, 2022). ඔහු තමා වැනි ම වූ තරුණ ක්‍රියාකාරීන් හා එක්ව සමාජ සදාචාර ප්‍රමිති ගොඩ නැංවීම හා අධ්‍යාපනයේ සිදු විය යුතු වෙනස්කම් පිළිබඳව සාකච්ඡා කළේ ය. දේශපාලනඥයකුගේ දුර්වල පාලනය හා දූෂිත ක්‍රියා හෙළිදරව් කිරීමට ඔහු විසින් ගත් උත්සාහය නිසා ඔහුට සිරගත වීමට පවා සිදු විය.

ඔහු විසින් අනාථ හා වරප්‍රසාද නො ලත් දුගී දරුවන් සඳහා නියුහොෆ් (Neuhof) නම් අධ්‍යාපන නේවාසිකාගාරයක් පිහිට වූ අතර ගුරුවරයකු ලෙස එහි දී ලද අත්දැකීම් පසුකාලීනව ඔහුගේ අධ්‍යාපන දර්ශනය හැඩ ගැස්වීමට සැලකිය යුතු කාර්යභාරයක් ඉටු කර ඇත (Ildiz, & Ahmetoglu, 2022). රූසෝගේ එමිල් නම් කෘතියෙන් ආභාසය ලද පෙස්ටලොසි ඔහුගේ අධ්‍යාපනික ප්‍රයත්නවල දී ඊට සමාන මූලධර්ම ක්‍රියාත්මක කිරීමට උත්සාහ කළේ ය. පෙස්ටලෝසි, රූසෝගේ අදහස් බෙහෙවින් අගය කළේ ය. දරුවන්ගේ ස්වාභාවික වර්ධනය හා පුද්ගලයාගේ නිදහසෙහි වැදගත්කම පිළිබඳ රූසෝගේ අදහස්, පෙස්ටලොසි තම දර්ශනයට පදනම් කර ගත්තේ ය. එසේ ම රූසෝගේ එමිල් (Emile) කෘතිය පෙස්ටලොසිගේ චින්තනයට ප්‍රබල බලපෑමක් ඇති කළේ ය. අධ්‍යාපනය ළමා කේන්ද්‍රීය විය යුතු

බවත් එක් එක් ශිෂ්‍යයාගේ පුද්ගලික අවශ්‍යතා හා හැකියා සමඟ පෙළ ගැසිය යුතු බවටත් වූ රූසෝගේ විශ්වාසය ඔහු තරව වැළඳ ගත්තේ ය (McKenna, 2010).

**බුද්ධි ප්‍රබෝධය**

"බුද්ධි ප්‍රබෝධය" දහඅට වැනි සියවසයේ යුරෝපය පුරා ව්‍යාප්ත වූ බුද්ධිමය ව්‍යාපාරයකි. විද්‍යාව හා දැනුම හඹා යාම, මානව ප්‍රගතිය පිළිබඳ ප්‍රබුද්ධත්වයේ විශ්වාසය හා සමාජ පරිවර්තනය සඳහා අධ්‍යාපනයේ ඇති බලය පෙස්ටලොසි අවධාරණය කළේ ය. සමාජ ප්‍රතිසංස්කරණය හා දැනුමේ ප්‍රගමනය පිළිබඳ ප්‍රබුද්ධ පරමාදර්ශ සමඟ පෙළ ගැසෙමින් පුද්ගල හා ප්‍රජාවන් නගා සිටුවීමේ මාධ්‍යයක් ලෙස ඔහු අධ්‍යාපනය දුටුවේ ය. රූසෝට අමතරව ජර්මානු දාර්ශනිකයකු හා ලේඛකයෙකු වන ජොහැන් ජියෝජ් සල්ෂර් (Johann Georg Sulzer) වැනි චින්තකයන්ගේ අභාසය ද පෙස්ටලොසි වෙත ලැබුණි.

**ගුරුවරයෙකු ලෙස නියුහොෆ් (Neuhof) පාසලේ අත්දැකීම්**

1770 දී දුගී දරුවන් සඳහා අධ්‍යාපන නේවාසිකාගාරයක් ලෙස ආරම්භ කළ නියුහොෆ් පාසල තුළින් ඔහු බොහෝ අත්දැකීම් ලැබී ය. දරුවාගේ ස්වභාවය හඳුනා ගෙන අධ්‍යාපනය ලබා දීම, පාසල් දරුවාට නිවස බඳු උණුසුම් ස්ථානයක් බවට පත් කිරීම, කුසලතා පුහුණුව කෙරෙහි අවධානය යොමු කිරීම ඒ අතර ප්‍රමුඛ වේ. මෙහි විෂය මාලාව අත්කම්, කියවීම්, ලිවීම්, භාෂා හා කලා පාඩම්වලින් සමන්විත විය (Laubach, 2011). මැහීම, ගෙතීම, විවීම තුළින් තම අධ්‍යාපන අවශ්‍යතා වෙනුවෙන් යම් මුදලක් උපයා ගැනීමට මෙහි අධ්‍යාපනය ලැබූ දරුවන්ට අවකාශ ලැබුණි. අධ්‍යාපනය වඩාත් ප්‍රායෝගික හා සදාචාරාත්මක වටිනාකම්වලින් හෙබි ආදරණීය පරිසරයක් තුළ සිදු විය යුතු බව නියෝන් පාසල හරහා ඔහු පෙන්වා දුනි. මේ අයුරින් ඔහු විසින් රචිත "Lienhard and Gertrud" නම් කෘතිය මගින් ඔහු ගම්බද පාසල් අකෘතියක් ද හඳුන්වා දී ඇත (Laubach, 2011).

**ස්ටැන්ස්හි (Stans) අත්දැකීම්**

ස්විස් රජය විසින් අලුතින් ආරම්භ කළ අනාථ ආශ්‍රමයක් වන ස්ටැන්ස් හි ප්‍රධානියා ලෙස පෙස්ටලොසි පත් කිරීම තුළින් ඔහුට

මෙම දුගී දරුවන් සමඟ නව අධ්‍යාපන ආකෘති අත්හදා බැලීමට අවස්ථාව ලැබුණි. මෙහි දී ඔහු පාසල තුළ පවුලක හැඟීම දැනවීමටත් සදාචාරාත්මක වටිනාකම ශක්තිමත් කිරීමටත් උත්සාහ දරන ලදී (Ildiz, & Ahmetoglu, 2022). එකී ප්‍රයත්නය සාර්ථක වූ බැවින් පාසල නිවස බඳු විය යුතු බවත් ගුරුවරයා මව/පියා බඳු විය යුතු බවත් අවධාරණය කළේ ය.

### බර්ග්ඩෝර්ෆ්හි (Bergdorf) අත්දැකීම්

Stans හි සේවය කිරීමෙන් අනතුරුව බර්ග්ඩෝර්ෆ්හි (Bergdorf) දුගී දරුවන් සඳහා අධ්‍යාපන ආයතනයක් ආරම්භ කළ අතර රජයේ අනුග්‍රහයෙන් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා එහි ශාඛාවක් ද විවෘත කරන ලදී (Ildiz, & Ahmetoglu, 2022). මෙහි සේවය කරන අතරතුර ඔහු ඉගෙනුම් ක්‍රම පිළිබඳ කෘති රචනා කළේ ය. එම කෘති මගින්,

- දරුවාට ගරුත්වයක් ලබා දීම
- දරුවාට කතා කිරීම හා දැනුම සොයා යාමට අවකාශ සැලසීම
- ක්‍රීඩා හා විනෝදය තුළින් ඉගැන්වීම
- පවුල් බැඳීම් හා සදාචාර පුහුණුව වැනි කරුණු අවධාරණය කළේ ය.

### ඉවර්ඩන්හි (Yverdon) අත්දැකීම්

වර්ෂ 1804 දී ඉවර්ඩන් හි අලුතින් ආරම්භ කරන ලද පාසලකට පෙස්ටලොසිට ආරාධනා ලැබුණු අතර එහි තරාතිරමකින් තොරව සියලු ම සමාජ පන්තිවලට අයත් දරුවෝ වූහ. මෙහි සේවය කරන අතරතුර දී පෙස්ටලොසි විසින් අධ්‍යාපන ක්ෂේත්‍රයට නව්‍ය භාවිතයන් කිහිපයක් හඳුන්වා දෙන ලදී (Horlacher, 2010).

- සංජානනය තුළින් සක්‍රීය වීම
- සරලව ඉගැන්වීම
- සමපදස්ථ ඉගැන්වීම

- කණ්ඩායම් සාකච්ඡා කිරීම
- වස්තූන් පාදක කර ගනිමින් ඉගැන්වීම

**පෙස්ටලොසිගේ අධ්‍යාපන දර්ශනය හා එහි ප්‍රධාන මූලධර්ම**

අධ්‍යාපනය පිළිබඳ පෙස්ටලොසිගේ අදහස්, ඔහුගේ දාර්ශනික චින්තනය හා මනෝවිද්‍යාත්මක සාධක මත පදනම් වී ඇත. එම අදහස් බොහෝ දුරට අධ්‍යාපනික දාර්ශනිකයකු වූ රූසෝගේ අදහස්වලින් පෝෂණය වී ඇත. අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විවිධ අත්හදා බැලීම් කළ ඔහු විශේෂයෙන් ම ළමා අධ්‍යාපනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කර ඇත. ඔහුගේ ළමා වියේ අත්දැකීම් හා ඔහු මුහුණ දුන් සමාජ ගැටලු හමුවෙහි දරුවකුගේ ප්‍රායෝගික පුහුණුව හා සමාජානුයෝජනය, ස්වාභාවික වර්ධනය, සාදාචාර සංවර්ධනය වැනි ඉසව් කරා සිය අවධානය යොමු කරන්නට විය (Laubach, 2011).

පෙස්ටලොසිට අනුව අධ්‍යාපනය යනු මිනිසාගේ නිසඟ ශක්තීන්හි සංවර්ධනය යි. ඔහු මිනිසාගේ සංවර්ධනය ගසක වර්ධනයට සමාන කළ අතර මුළු ගස ම බීජවලට ආවේනික වන බවත් බීජය වර්ධනය වීමට නම් නිසි පරිසරයක් අවශ්‍ය වන බවත් ඒ අයුරින් ම සමස්ත මිනිසා ම ළදරුවාට ආවේනික වන බවත් ළදරුවාට මිනිසෙකු ලෙස වැඩීමට නිසි පරිසරයක් අවශ්‍ය බවත් පෙන්වා දුනි (Horlacher, 2010). ඔහුට අනුව අධ්‍යාපනය යනු දැනුම බාහිරින් පැටවීම නොව මිනිසාගේ සහජ ශක්තීන් පිටතට ගැනීම සහ ඒවා වර්ධනය කර ගැනීම යි. මෙම වර්ධනය ස්වාභාවික, සුසංයෝගී හා ප්‍රගතිශීලි එකක් විය යුතු ය.

"අධ්‍යාපනය යනු ස්වාභාවික, සුසංයෝගී හා ප්‍රගතිශීලි ලෙස මිනිසාගේ සහජ ශක්තීන්හි සිදු වන අනුක්‍රමික සංවර්ධනයකි" යැයි ඔහු අවධාරණය කළේ එබැවිනි (Sinclair, 2014).




**පෙස්ටලොසිට අනුව අධ්‍යාපනයේ අරමුණු**

අධ්‍යාපනය තුළින් මිනිසා යහපත් මිනිසකු බවට පත් කළ යුතු බව පෙස්ටලොසි අවධාරණය කරයි. යහපත් මිනිසෙකු බිහි කිරීම තුළින් යහපත් ප්‍රීතිමත් සමාජයක් නිර්මාණය කළ හැකි බව ඔහු පැවසී ය. එම නිසා මිනිසාගේ සහජ හැකියා මෙන් ම ඔහු තුළ ඇති ආදරය, කරුණාව, සංවේදනය, ආත්ම විශ්වාසය වැනි ගුණාංග ද අධ්‍යාපනය තුළින් දරුවකු තුළ සංවර්ධනය කළ යුතු බව ඔහු පෙන්වා දෙයි (Schultz, 2017). එසේ ම ආගම හා සදාචාරය අධ්‍යාපනයේ කොටසක් විය යුතු බව ඔහුගේ තවත් සුවිශේෂ ඉගැන්වීමකි. ඔහුගේ දර්ශනය ඇසුරින් ඉදිරිපත් තළ අධ්‍යාපන අරමුණු කිහිපයක් හඳුනා ගත හැකි ය.

01. මිනිසාගේ සහජ හැකියා සංවර්ධනය (කායික, මානසික, සදාචාරාත්මක හැකියා ස්වාභාවිකව හා අනුක්‍රමිකව සංවර්ධනය කිරීම)
02. මානව ගුණාංගවල සංවර්ධනය (ආදරය, සහකම්පනය, දයාව, පරාර්ථකාමී බව, ත්‍යාගශීලි බව ආදී ගුණාංග)
03. තමන් මත යැපෙන මිනිසකු බිහි කිරීම (අනුන් මත නො යැපී තමාගේ හැකියාවන් තුළින් ජීවත් වීම සඳහා උපයන අයෙකු බිහි කිරීම)
04. සමාජ ප්‍රගමනය (තම හැකියාවන් දියුණු කර ගැනීම තුළින් සමස්ත සමාජයේ ම දියුණුවක් ඇති කිරීම)

05. ආගමික හා සදාචාරාත්මක සංවර්ධනය (ආගම හා සදාචාරය මිනිස් හැසිරීම් සඳහා ස්ථිර පදනමක් සපයන බවත් එබැවින් ම මෙය අධ්‍යාපනයේ ප්‍රමුඛතම අරමුණක් විය යුතු බව)

**පෙස්ටලොසිට අනුව විෂය මාලාව**

පෙස්ටලොසි සිය අධ්‍යාපන දර්ශනයේ දී වැඩි අවධානයක් යොමු කර ඇත්තේ පාසල් අධ්‍යාපනය කෙරෙහි ය. අවුː 03 හා අවුː 13 අතර දරුවන් ඔහුගේ ප්‍රමුඛ අවධානයට යොමු වී ඇත. අධ්‍යාපනයේ දී පළමුව සිදු විය යුත්තේ දරුවන්ගේ සහජ දක්ෂතා සංවර්ධනය කිරීමයි. පාසල් විෂයමාලාව ඊට ගැළපෙන අවස්ථා සම්පාදනය කරන්නක් විය යුතු ය (Schultz, 2017). ක්‍රීඩාව, අවට පවතින දෑ නිරීක්ෂණය, ස්වාභාවික පරිසරය නිරීක්ෂණය ආදියට පාසල් විෂයමාලාවේ ඉඩකඩ වෙන් විය යුතු බව ඔහුගේ අදහස යි. අදහස් ප්‍රකාශනයෙහි ලා භාෂාවේ වැදගත්කම පැහැදිලි කළ ඔහු භාෂාව ප්‍රාථමික විෂය මාලාවට අනිවාර්යයෙන් එක් කළ යුතු බව පෙන්වා දුනි. සංගීතය හා කලාව ද අදහස් ප්‍රකාශනයෙහි ලා මහඟු කාර්යයන් ඉටු කරන බැවින් එය ද පාසල් විෂය මාලාවට එක් කළ යුතු බව ඔහුගේ ඉගැන්වීම යි. දුගී දරුවන්ට අධ්‍යාපනය ලබා දීමේ වැදගත්කම නිරන්තරයෙන් ඉස්මතු කළ පෙස්ටලොසි අධ්‍යාපනය තුළින් ඔහුගේ ජීවන තත්ත්වය නගා සිටුවීමේ අරමුණින් වෘත්තීය අධ්‍යාපනයේ වැදගත්කම පහදා දුන් චින්තකයෙකි. ඒ අනුව කෘෂි කර්මාන්තය, ගොවිපළකරණය, මැහුම්ගෙතුම් ආදිය විෂය මාලාවට හඳුන්වා දුන්නේ ය. මීට අමතරව පූර්ණ මිනිසකු බිහි කිරීම උදෙසා ආගමික හා සදාචාර අධ්‍යාපනය අනිවාර්යයෙන් විෂය මාලාවට එක් විය යුතු බව ඔහු පෙන්වා දුන්නේ ය (Mesquida et al., 2017).

**පෙස්ටලොසිගේ ඉගෙනුම් ක්‍රම**

පෙස්ටලොසි, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මනෝවිද්‍යාත්මක පසුබිමක් මත ගොඩ නැගිය යුත්තක් බව පෙන්වා දුන් අතර දරුවකුගේ බුද්ධිය අවධි 3ක් යටතේ ඔහු විස්තර කළේ ය. දරුවෙක් පළමුව සංවේදී ඉන්ද්‍රියයන් හරහා යම් වස්තුවක හැඩය ග්‍රහණය කර ගනියි. දෙවන අවධියේ දී එය වඩාත් පැහැදිලි කර ගන්නා අතර තෙවන අවධියේ දී දැනුම ගොඩ නගා ගනියි. දරුවන්ගේ මෙම ස්වභාවය

ඔවුන්ට ඉගැන්වීමේ දී භාවිත කළ යුතු අතර ක්‍රමක්‍රමයෙන් ඉගෙනීමට අවස්ථාව ලබා දිය යුතු ය (Rajawat & Patel, 2015). දරුවා ගොඩ නගා ගන්නා දැනුම ස්ථාවර කිරීම සඳහා නැවත නැවත භාවිතයට අවස්ථා දිය යුතු ය. පෙස්ටලොසි විසින් ඉගෙනුම් ක්‍රම පිළිබඳ දැක්වූ අදහස් වර්තමානයේ දී ඉගෙනුම් මූලධර්ම ලෙස භාවිත වේ. ඒවා නම්

01. මනෝවිද්‍යාත්මක පදනමක් මත ඉගෙනුම් ක්‍රම යොදා ගැනීම

දරුවා ස්වභාවයෙන් ම නිදහසට ප්‍රිය කරයි. ක්‍රියාකාරකම්වලට ප්‍රිය කරයි. එකිනෙකාට වෙනස් වෙයි. එබැවින් නිදහස්ව හා ස්වාධීනව ක්‍රියාකාරකම්වල යෙදෙමින් ඉගෙනීමට අවස්ථාව ලබා දිය යුතු වේ.

02. සංවේදනයක් මගින් අධ්‍යාපනය ලබා දීම

දැනුම ලබා ගැනීමේ දී සංවේදනයක් ඊට පදනම සපයන බවත් සැබෑ අත්දැකීම් විඳිමින් ඉගෙන ගන්නට අවස්ථාවක් ලබා දිය යුතු බවත් මින් අදහස් වේ. අසමින් හා බලමින් ඉගෙනීමට දරුවන්ට ඉඩ දිය යුතු ය.

03. මානසික ක්‍රියාකාරීත්වය අනුව ඉගැන්වීම

දරුවන්ගේ බුද්ධි වර්ධනය හා මොළයේ ක්‍රියාකාරිත්වය ක්‍රමිකව වර්ධනය වන නිසා දරුවන්ට පළමුව දේවල් හඳුනා ගැනීමට හැකි වන පරිදි ඉගෙනුම් සැලසුම් කළ යුතු ය. එම දැනුම ස්ථාවර කිරීම සඳහා සතතාභ්‍යාසයේ යෙදවිය යුතු ය.

04. සරල බවේ සිට සංකීර්ණත්වය දක්වා ඉගැන්වීම

ඉගැන්වීමේ දී සරල දෑ මුලින් ම ද සංකීර්ණ දෑ හා ඊටත් පසුව ඉතා සංකීර්ණ දෑ ඊටත් පසුව ද ඉගැන්විය යුතු ය. ඉගෙනුම් අවස්ථා සරල බවේ සිට සංකීර්ණත්වය දක්වා ලබා දිය යුතු ය.

05. එක් සංකල්පයක් තහවුරු කර ගැනීමෙන් පසු ඊළඟ සංකල්පයට යාම

දරුවා එක් සංකල්පයක් පූර්ණ වශයෙන් තහවුරු කිරීමට පෙර තවත් සංකල්පයකට යොමු නො කළ යුතු ය.

06. සහජ දක්ෂතා වර්ධනයට හා සංවර්ධනයට අවස්ථා සැලසීම

ක්‍රීඩාව, නිරීක්ෂණය, ගවේෂණය, ස්වයං අවධානය වැනි ක්‍රම මගින් ශිෂ්‍ය හැකියා හඳුනා ගත හැකි ක්‍රම සම්පාදනය කිරීම

07. භාෂාව ඉගැන්වීම

කථනයෙන් පසු කියවීමත්, කියවීමෙන් පසු ලිවීමත් කළ යුතු බව

08. වාචික ගණිතය හා ලිඛිත ගණිතය

පරිසරයේ ඇති ද්‍රව්‍ය ඇසුරින් වාචික ගණිතය ඉගෙනීමෙන් පසු ඒ ලද පුහුණුව මගින් ලිඛිත ගණිත ගැටලු විසඳීම.

09. භූගෝලය, ස්වභාව විද්‍යාව හා කාර්මික අධ්‍යාපනය

එම විෂය සම්පූර්ණයෙන් ම නිරීක්ෂණය, ගවේෂණය, අභ්‍යාසකරණය මගින් ඉගැන්වීම

10. විද්‍යා අධ්‍යාපනය

දරුවාට ක්‍රියාවෙන් ඉගෙනුමට අවස්ථා ලබා දී ලබන ප්‍රගතිය මත ගුරුවරයාගේ මැදිහත් වීම සිදු කිරීමයි.

11. සදාචාර අධ්‍යාපනය

පෙස්ටලොසිට අනුව සදාචාර අධ්‍යාපනය වෙන ම ලබා දිය යුත්තක් නොව පාසල් පරිසරය, සමාජ වටපිටාව තුළින් දරුවා තුළ ගොඩ නැගෙන්නක් වේ (Horlacher, 2010). මේ සඳහා ගුරුවරයා හා දරුවා අතර පියකු හා දරුවකු අතර පවතින සම්බන්ධතාවක් පැවතිය යුතු බව ඔහුගේ අදහස යි. මේ සියලු කරුණු සලකා බැලූ විට පෙස්ටලොසිගේ අධ්‍යාපන දර්ශනයේ එන ප්‍රධාන මූලධර්ම 4කි.

01. කරමින් ඉගෙන ගැනීම - දරුවන් වඩාත් හොඳින් ඉගෙන ගන්නේ ක්‍රියාවෙන් බවත් ඒ සඳහා අධ්‍යාපන ක්‍රමය ප්‍රායෝගිකත්වයට නැඹුරු විය යුතු බව

02. සබඳතාවල වැදගත්කම - ඉගෙනීමේ දී ගුරුවරයා හා දරුවා අතර සම්බන්ධය ඉතා වැදගත් බවත් ගුරුවරයා දරුවාට මවක, පියෙකු බවත් පන්ති කාමරය දරුවාට නිවස බඳු උණුසුම් ආධාරක සහිත විභව්‍යතා පෝෂණය කරන පරිසරයක් කළ යුතු බව

03. සොබා දහමේ වැදගත්කම - එළිමහනේ කාලය ගත කරමින්, ස්වාභාවික පරිසරය නිරීක්ෂණය කරමින්, සත්‍ය ලෝකය ගවේෂණය කිරීම දරුවාට ප්‍රබල ඉගෙනුමක් වන බව

04. සරල බවේ වැදගත්කම - අනවශ්‍ය සංකීර්ණත්වය ප්‍රතික්ෂේප කරමින් සරලව හා සංක්ෂිප්තව පැහැදිලි අධ්‍යාපනයක් දරුවාට ලබා දිය යුතු බව

පෙස්ටලොසි අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉදිරිපත් කළ සංකල්ප හා අදහස් පහත පරිදි සාරාංශ කොට දැක්විය හැකි ය.

1. අධ්‍යාපනය මගින් දරුවාගේ බුද්ධිමය, චිත්තවේගීය, සදාචාරාත්මක හා කායික වශයෙන් පරිපූර්ණ වර්ධනයක් ඇති කිරීම
2. අධ්‍යාපනය ළමා කේන්ද්‍රීය ප්‍රවේශ ඔස්සේ සිදු කිරීම
3. ක්‍රියාවෙන් හා සොබා දහම තුළින් ඉගෙනුමට අවස්ථා ලබා දීම
4. දරුවාගේ හිස, අත, හදවත සංවර්ධනය කිරීම
5. දරුවන්ගේ රුචිකත්වය, හැකියා හා විවිධත්වය මත එක් එක් දරුවාට සුදුසු ඉගෙනුම් ක්‍රම යොදා ගැනීම
6. පාසල තුළ දරුවාට නිදහස්, ආදරණීය හා උණුසුම් ස්වභාවයක් ඇති කිරීම
7. අධ්‍යාපනය තුළින් සදාචාර හා චරිත සංවර්ධනය ඇති කිරීම
8. ඉගෙනුම් ක්‍රියාවලියට සංවේදී අත්දැකීම් හා චිත්තවේගීය නියැළීම් කාර්ය අන්තර්ගත කිරීම
9. අධ්‍යාපනය තුළින් ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා වෘත්තීය අධ්‍යාපනය ලබා දීම

10. ගුරුවරයා හා දරුවා අතර පියකු හා දරුවකු අතර බැඳීමක් ඇති කිරීම
11. තමා කැමති දේ ඉගෙනීමට ගුරුවරයා, දරුවාට පහසුකම් සපයන්නෙක් ලෙස ක්‍රියා කිරීම
12. අධ්‍යාපනය දඬුවමින් තොර වීම හා ආදරය තුළින් දරුවා හික්මවීම
13. ක්‍රීඩාව තුළින් ඉගෙනුමට අවස්ථා සැලසීම
14. ස්වයං අධ්‍යාපනයට හා ස්වයං ඇගයීමට දරුවාට අවස්ථා ලබා දීම
15. ප්‍රජා හා කාන්තා අධ්‍යාපනයට අවස්ථාව ලබා දීම
16. සහයෝගී ඉගෙනුම් අවස්ථා ලබා දීම තුළින් සමාජ කුසලතා වර්ධනය කිරීම
17. ඉගෙනුම් ක්‍රම හා විෂය කරුණු සරල හා පැහැදිලි වීම
18. විෂය මාලා ඒකාබද්ධ කිරීම
19. සංවේදී ඉගෙනුම් ප්‍රවේශ නිර්මාණය කිරීම
20. ක්‍රියාකාරී ඉගෙනුමක් මගින් දරුවන් සිතීමට හුරු කිරීම
21. අඛණ්ඩ ගුරු වෘත්තීය සංවර්ධනය

**පෙස්ටලොසිගේ අධ්‍යාපන දර්ශනය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියට උපයෝගී කර ගත හැකි ආකාර**

වර්තමාන ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය පිළිබඳව සැලකීමේ දී ශිෂ්‍ය කේන්ද්‍රීය ප්‍රවේශය ඔස්සේ සකස් වූ විෂය මාලාවක් ඇතත් එය ප්‍රයෝගිකව ක්‍රියාත්මක වීමේ දී ගුරු කේන්ද්‍රීය, ශිෂ්‍ය කේන්ද්‍රීය මෙන් ම මධ්‍යස්ථ ප්‍රවේශය ඔස්සේ ද ක්‍රියාත්මක වන අයුරු නිරීක්ෂණය වේ. කෙසේ වෙතත් පෙස්ටලොසිගේ අදහස් අදටත් උචිත බැවින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ ඵලදායීතාව ඉහළ නැංවීම සඳහා එම ඉගැන්වීම් යොදා ගත හැකි අයුරු විමසා බලමු.

පෙස්ටලොසිගේ හිස, අත හා හදවත සංවර්ධනය කිරීමේ සංකල්පයට පදනම් වී ඇත්තේ දරුවාගේ බුද්ධිමය, ශාරීරික හා

චිත්තවේගීය අංශ අධ්‍යාපනය තුළින් ආමන්ත්‍රණය කළ යුතු බව යි (Mesquida et al., 2017). හිස සංවර්ධනය මගින් දරුවාගේ බුද්ධිමය හැකියාවන් වර්ධනය කර ගැනීම සඳහා උචිත විවේචනාත්මක චින්තනය, ගැටලු විසඳීමේ කුසලතා, විශ්ලේෂණාත්මක තර්කනය අවධාරණය කෙරේ. සුමට විෂය මාලාවක් ලබා දීම හරහා ගවේෂණ, විමර්ශන පදනම් කර ගත් ඉගෙනුම් ක්‍රම යොදා ගැනීම මෙහි දී කළ යුතු වේ. නිදසුන් ලෙස විද්‍යාගාර පරීක්ෂණ, කණ්ඩායම් සාකච්ඡා දැක්විය හැකි ය.

අත සංවර්ධනය ලෙස දරුවන්ගේ කායික හැකියාවන්ට අදාළ කුසලතා වර්ධනය සඳහා ක්‍රීඩාව හා ශාරීරික අධ්‍යාපනය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම අදහස් වේ (Adelman, 2000). උගත් දෑ ප්‍රායෝගිකව අත්හදා බැලීමට අවස්ථාව ලබා දීම, ක්‍රියාකාරී ප්‍රිය ජනක ඉගෙනුම් අවස්ථා ලබා දීම ආදිය නිදසුන් කොට දැක්විය හැකි ය. පැළයක් සිටුවා එය රැක බලා ගනිමින් එහි වර්ධනය අත්දැකීමට අවස්ථාව ලබා දීම නිදසුන් වේ.

හදවත සංවර්ධනය ලෙස චිත්තවේගීය හා සදාචාරාත්මක සංවර්ධනය අදහස් වේ (Latham, 2002). සංවේදනය, මානව දයාව, සමාජ වගකීම්, අගනාකම්, වටිනාකම් හඳුනා ගැනීමට ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියට හා පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට ඉඩ හසර සැලසිය යුතු ය. ඒ සඳහා සාරධර්ම වැඩසටහන් හා ආකල්ප සංවර්ධන වැඩසටහන් විෂය මාලාවට එක් කළ හැකි ය. මීට අමතරව පාසල් පරිසරය තුළින් යහපත් ආකල්ප ගොඩ නැගීමට දරුවාට අවස්ථාව සැලසිය යුතු ය. විශිෂ්ට අධ්‍යයන ව්‍යවහාර භාවිතය ද ඒ සඳහා උචිත වේ. පාසල් පරිසරය රැක ගැනීම, එකිනෙකාට උදවු කර ගැනීම, ආගමික වැඩ සටහන්, ප්‍රජා වැඩසටහන් නිදසුන් වේ. දරුවාට ආදරණීයව සැලකීම තුළ හදවත සංවර්ධනය වඩාත් සාර්ථක වේ.

ස්වාභාවික හා එළිමහන් අධ්‍යාපනයට අවස්ථා ලබා දීම පෙස්ටලොසි දර්ශනයේ වැදගත් ඉගැන්වීමකි. ස්වභාව ධර්මය හා බද්ධ වෙමින් ඉගෙනීම තුළ දරුවෙකුගේ සමස්ත යහපැවැත්ම රඳා පවතින බව පෙස්ටලොසි පවසයි (Latham, 2002). දරුවා ස්වාභාවික පරිසරය තුළින් මනා ඉගෙනුමක් ලබන බැවින් ඒ සඳහා අවස්ථාව

ලබා දිය යුතු ය. ශ්‍රී ලංකාවෙහි දැනුම කේන්ද්‍රීය විෂයමාලාව තුළ මේ සඳහා ඉඩකඩ ලැබෙනුයේ අවම වශයෙනි. ක්ෂේත්‍ර චාරිකා, පරිසර ව්‍යාපෘති/කඳවුරු (Nature Walk, Nature ride, Beach Camp) වැනි අවස්ථා ශ්‍රී ලංකාවේ විෂය මාලාවට ඇතුළත් කළ හැකි ය.

පාසල දරුවාට නිවස බඳු ස්ථානයක් බවට පත් කිරීම පෙස්ටලොසි අවධාරණය කළ වැදගත් ඉගැන්වීමකි (Sinclair, 2014). මේ සඳහා ශ්‍රී ලංකාවේ පාසල්වල පහසුකම් වැඩි කිරීම, ළමා මිතුරු ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම, පන්ති කාමර පිරිසිදු කිරීම, ප්‍රියජනක හා සුව පහසු ලෙස නඩත්තු කිරීම, දරුවාට මවක පියෙකු ලෙස සැලකීමට ගුරු පුහුණු වැඩසටහන් හරහා ඔවුන්ගේ ආකල්ප සංවර්ධනය, දරුවන්ට දඬුවමින් තොර නිදහසේ ඉගෙන ගත හැකි නම්‍යශිලී විෂයමාලාවක් සකස් කිරීම ආදිය දැක්විය හැකි ය. විශේෂයෙන් ම සනීපාරක්ෂාව හා පෝෂණය පාසල තුළින් ලබා දීම වැදගත් ය. ඒ සඳහා පෝෂණ වැඩසටහන්, සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැදගත් වේ (McKenna, 2010).

වෘත්තීය පුහුණුව ලබා දීම පෙස්ටලොසි ඉදිරිපත් කළ තවත් සර්වකාලීන අදහසකි. තම නියුහොෆ් පාසල හරහා දුගී බව තුරන් කිරීම අරමුණු කර ගනිමින් වෘත්තියක් ඉගෙනීමේ ඇති වැදගත්කම තහවුරු කළේ ය (Latham, 2012). අධ්‍යාපනය තුළින් ප්‍රතිලාභ ලබා ගැනීම උදෙසා මැහුම්, ගෙතුම්, විවීම, කෘෂි කර්මාන්තය, වඩු වැඩ, අත්කම්, කැටයම් ශිල්පය, මැටි කර්මාන්තය ආදී වෘත්තීන් ශ්‍රී ලංකාවේ විෂයමාලාවට එකතු කළ හැකි ය. මුදල් උපයා ගත හැකි ජීවන මාර්ගයකට දරුවන් පුහුණු කිරීම තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවිය හැකි ය. මෙහි දී විෂයමාලාව ප්‍රාදේශීයව ව්‍යාප්තව ඇති වෘත්තීන්, කර්මාන්ත හා සම්පත් කෙරෙහි කේන්ද්‍රගත වීම වඩාත් ඵලදායී වේ. නිදසුන් ලෙස රජරට දරුවන්ට කෘෂිකර්මය හා පසු අස්වනු තාක්ෂණය, සබරගමු දරුවන්ට මැණික් ආශ්‍රිත කර්මාන්ත, නුවරඑළියේ දරුවන්ට සංචාරක කර්මාන්තය, එළවළු වගාව, වානිජ මල් වගාව දැක්විය හැකි ය.

ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රම යොදා ගැනීමේ වැදගත්කම ඔහු අවධාරිත තවත් වැදගත් ඉගැන්වීමකි (McKenna, 2010). වර්තමාන

ශ්‍රී ලංකික අධ්‍යාපනය තුළ ක්‍රියාත්මක වන්නේ නාමික ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ක්‍රමයකි. එය සැබෑවට ම ක්‍රියාත්මක කිරීමට නම් දරුවාට ක්‍රියාත්මක වන්නට ඉඩ දී ගුරුවරයා පහසුකම් සලසන්නකුගේ කාර්යභාරය ඉටු කළ යුතු ය. ගවේෂණ ක්‍රමය, නිරීක්ෂණ ක්‍රමය, කණ්ඩායම් ව්‍යාපෘති, නිර්මාණාත්මක ක්‍රියාකාරකම්, ව්‍යාපෘති පාදක ඉගෙනුම, ගැටලු පාදක ඉගෙනුම, ඉදිරිපත් කිරීම්, පරීක්ෂණ ක්‍රමය, අනාවරණ ක්‍රමය වැනි ඉගෙනුම් ක්‍රම ක්‍රියාත්මක කළ යුතු ය. ඒ සඳහා අවශ්‍ය පහසුකම් පාසල් පද්ධතිය හරහා සැපයිය යුතු ය.

අධ්‍යාපනයේ දී දෙමාපියන් හා ප්‍රජාව ඊට දායක කර ගත යුතු බව පෙස්ටලොසිගේ අදහසයි. වත්මන් ලාංකීය අධ්‍යාපන ක්‍රමය තුළ ප්‍රජා සහභාගීත්වය සෙසු රටවලට සාපේක්ෂව සිදු වන්නේ ඉතා අඩු මට්ටමකිනි. ඒ සඳහා දෙමාපිය - ද්‍ර දරු සහයෝගීතා ව්‍යාපෘති, ගුරු දෙගුරු රැස්වීම්, ප්‍රජා හවුල් කාරීත්වයෙන් අමතර ඉගැන්වීම්, සම්පත් දායකයින්ගේ මැදිහත් වීම ලබා ගැනීම, නිවසේ දී දිරි ගැන්වීම සඳහා දෙමාපියන් දැනුවත් කිරීම වැනි දෑ අත්‍යවශ්‍ය වේ.

දරුවන්ගේ ප්‍රජානන සංවර්ධනයට සාපේක්ෂව සරල භාවයේ සිට සංකීර්ණත්වය දක්වා ක්‍රමිකව ඉගෙනුම සිදු විය යුතු බව පෙස්ටලොසි පෙන්වා දෙයි. මෙම ඉගැන්වීමට අනුව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය තුළ,

- ප්‍රාථමික විෂයමාලාවේ අනවශ්‍ය සංකීර්ණත්වය ඉවත් කිරීම
- ගණිතය, විද්‍යාව වැනි විෂයවල මූලික සංකල්ප තහවුරු කිරීමෙන් පසු ඉදිරියට ගෙන යාම.
- සරල ඉගෙනුම් ක්‍රම / ආධාරක භාවිත කිරීම
- සංකීර්ණ විෂය කරුණු අවබෝධ කරවීම සඳහා සරල උදාහරණ / අත්දැකීම් යොදා ගැනීම
- වයස් / බුද්ධි මට්ටම් අනුව විෂය මාලාව පෙළ ගැස්වීම
- බහු ඉන්ද්‍රිය ඉගෙනුම් ක්‍රම යොදා ගැනීම

යන කරුණු සම්පූර්ණ කළ යුතු වේ.

ඉගෙනීමේ දී සංවේදනයේ ඇති වැදගත්කම පෙන්වා දුන් පෙස්ටලොසි ඇසීම, දැනීම, විඳීම, දැනීම, කිරීම තුළින් දරුවා වඩාත් ඵලදායි ඉගෙනුමක් ලබන බව පෙන්වා දුන්නේ ය (Costa, 2014). මෙම ඉගැන්වීම ප්‍රායෝගිකව ලාංකීය පාසල් පන්ති කාමරයට යොදා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ගුරුවරුන්ට ශ්‍රව්‍ය/දෘශ්‍ය ආධාරක, ස්පර්ශක, නිදර්ශක, සැබෑ අත්දැකීම් වැනි බහු ඉන්ද්‍රිය ආධාරක උපදේශන ශිල්පීය ක්‍රම යොදා ගත හැකි වේ.

ගුරු වෘත්තීය සංවර්ධනය පෙස්ටලොසි පෙන්වා දුන් අතිශය වැදගත් කරුණකි. ඒ අනුව හොඳින් පුහුණු වූ හා උද්යෝගීමත් ගුරුවරුන්ගේ කාර්ය භාරයෙහි වැදගත්කම අවධාරණය කළේ ය (Laubach, 2017). ශ්‍රී ලංකාවේ ගුරු අධ්‍යාපන ආයතනවලට පෙස්ටලොසිගේ දර්ශනයට සමගාමීව ගුරුවරුන් සන්නද්ධ කරන වෘත්තීය සංවර්ධන වැඩසටහන් භාවිත කළ හැකි ය. ධාරිතා සංවර්ධනය සඳහා වැඩ මුළු, මනෝවිද්‍යා උපදේශන පාඨමාලා, සහයෝගී ගුරු ප්‍රජාවක් බිහි කිරීම සඳහා වූ වැඩසටහන් සංවිධානය කළ හැකි ය.

විවිධ දරුවන්ගේ හැකියා හා රුචිකත්වයන් විවිධ වේ. දරුවන්ට තමා කැමති දේ කැමති අයුරින් ඉගෙනීමට ඉඩ සැලසිය යුතු ය (Adelman, 2000). මේ සඳහා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ දරුවාට තමා කැමති ක්ෂේත්‍රය තෝරා ගැනීමට නිදහස හා පහසුකම් සැලසීම, සිසුන්ගේ ස්වභාවය අනුව සුදුසු ඉගැන්වීම් ක්‍රම තෝරා ගැනීමට ගුරුවරයාට නිදහස ලබා දීම, ඒ සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම කළ යුතු ය. නිදසුනක් ලෙස ශාඛ හා සතුන් පිළිබඳ හැදෑරීමට කැමති ශිෂ්‍යයන්ට ඒවා නිරීක්ෂණයට, ගවේෂණයට හා වැඩිදුර තොරතුරු අනාවරණයට පහසුකම් සැලසීම දැක්විය හැකි ය.

පෙස්ටලොසිගේ අධ්‍යාපනය පිළිබඳ දාර්ශනික අදහස් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියට එක් කර ගත හැකි අතර ඒ තුළින් වර්තමාන ශ්‍රී ලාංකික අධ්‍යාපන පද්ධතිය තුළ පවතින ඇතැම් දුර්වලතා අවම කර ගනිමින් සතුටින්, නිදහසේ ඉගෙන ගත හැකි ඉගෙනුම් පරිසරයක් ලාංකික දරුවන්ට උරුම කර දීමේ හැකියාවක් පවතියි.

**සමාලෝචනය**

පෙස්ටලොසිගේ අධ්‍යාපනය පිළිබඳ ඉගැන්වීම් සාර්වකාලීන අගයකින් යුතු වේ. දරුවන්ගේ සමස්ත පෞරුෂ සංවර්ධනය ඉලක්ක ගත වූ ඉගැන්වීම් රැසක් ඔහු ඉදිරිපත් කොට ඇත්තේ සිය අත්දැකීම් මත පදනම් වෙමිනි. ඒවා න්‍යායාත්මක මෙන් ම ප්‍රායෝගික ද වේ. හිස, හද, අත සංවර්ධනය ඉලක්කගත වූ සමස්ත ඉගැන්වීම් තුළින් ප්‍රායෝගිකත්වයට ප්‍රමුඛත්වය සැපයූ බවක් දැකිය හැකි ය. හිස, හද, අත හෙවත් ප්‍රජානන, ආවේදන, මනෝචාලක ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා අතිශය ප්‍රායෝගික විෂයමාලාවක් ඉදිරිපත් කළ පෙස්ටලොසි එම විෂයමාලාව දරුවා වෙත සමීප කළ හැකි ගුරුවරයෙක් නිර්මාණය කිරීම විෂයයෙහි ද අවධානය යොමු කොට තිබේ. ඒ, ගුරු වෘත්තීය සංවර්ධනය කෙරෙහි පුළුල් අවධානයක් යොමු කරමිනි. මතක තබා ගැනීම කෙරෙහි කේන්ද්‍ර ගත වූ ඉගෙනුම් ක්‍රමවේදය බැහැර කිරීම ඔහුගේ ඉගැන්වීම්හි දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයකි. ගුරුවරයා බලධාරියා ලෙස හැසිරෙන, සිසුන්ට නිදහසේ සිතීමට, ක්‍රියා කිරීමට හා ඉගෙන ගැනීමට අවකාශයක් නො වන පන්ති කාමර සංකල්පය පෙස්ටලොසි බැහැර කළේ ය. එනම් ගුරු කේන්ද්‍රීය ඉගෙනුම ප්‍රතික්ෂේප කළ හෙතෙම ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුමෙහි වටිනාකම දිරිමත් කළේ ය. නිවසක පැවතිය යුතු ආදරණීය බව පන්ති කාමරය තුළ පැවතිය යුතු බවත් ගුරුවරයා හා සිසුවා අතර සම්බන්ධය මව් පිය දූදරු සම්බන්ධයක් ලෙස පැවතිය යුතු බවත් අවධාරණය කළේ ය. ලොව පහළ වූ තවත් ශ්‍රේෂ්ඨ අධ්‍යාපනඥයකු වන බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම් සමග බොහෝ දුරට සමපාත වන ඉගැන්වීමකි, එය. එමෙන් ම සරල භාවයේ සිට සංකීර්ණත්වය දක්වා දරුවා ක්‍රමිකව රැගෙන යාම, දරුවාගේ රුචිකත්වයට ප්‍රමුඛතාව ලබා දීම ඔහුගේ ඉගැන්වීම්වල දැකිය හැකි සුවිශේෂී ලක්ෂණ වේ. වෙසෙසින් ම වත්මන් ශ්‍රී ලංකාවේ පවතින තරගකාරී විභාග කේන්ද්‍රීය අධ්‍යාපනයෙන් මිදී අධ්‍යාපනයෙන් ඉලක්කගත පූර්ණ මිනිසා විසි එක් වැනි සියවසට උචිත ලෙස ගොඩ නැගීමට මෙම ඉගැන්වීම් ප්‍රායෝගිකව යොදා ගත හැකි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

චන්ද්‍රසේකර, එච්. එම්. (2009). *අධ්‍යාපනයේ දාර්ශනික පදනම.* කොට්ටාවඃ සාර ප්‍රකාශන.

Adelman, C. (2000). Over Two Years, What did Froebel say to Pestalozzi?. *History of Education*. 29 (2): 103-114, 2000, doi:/10.1080/004676000284391.

Bredekamp, S. (2014). *Effective Practices in Early Childhood Education Building a Foundation*. Second Edition. PEARSON. ISBN:13978-0-13-285333-0.

Da Costa, D. A. (2014). The conceptions and contributions of pestalozzi, grube, parker and dewey for teaching arithmetic in elementary level: the concept of number. *Revista História da Educação*, vol. 18, Num. 42, enero-abril, pp. 37-59 Associação Sul-Rio-Grandense de Pesquisadores em História da Educação Rio Grande do Sul, Brasil.

Horlacher, R. (2010). "Schooling as a Means of Popular Education: Pestalozzi's Method As A Popular Education Experiment". *Paedagogica Historica*, 47 (1-2): 65-75, 2011 doi: 10.1080/00309230.2010.530286.

Ildiz, G. J. & Ahmetoglu, E. (2022). *The johann heinrich pestalozzi approach*. ResearchGate. Uploaded by Gokcen İlhan Ildiz on 09 January 2022.

Latham, J. E. (2002). Pestalozzi and James Pierrepoint Greaves: A Shared Educational Philosophy. *History of Education*. 31(1): 59-70, doi: 10.1080/00467600110102327.

Laubach, M. (2011). Pestalozzi and His Significance in Democratic Education. *Journal of Philosophy and History of Education*. 61(1): 185-194, 2011 http://www.journalofphilÈophyandhistoryofeducation.com/jophe61.

McKenna, M. K. (2010). Pestalozzı Revısıted: Hope and Cautıon For Modern Educatıon. *Journal of Philosophy and History of Education*. 60 121-125.

Mesquida, P., Maurício, & F. P., Bernz, E. (2017). *The Pestalozzi Method: Mathematics as a Way to the Truth*. Creative Education 8: 1088-1098, 2017, doi : 10.4236/ce.2017.87078.

Nair, J. (2022). *Johann Heinrich Pestalozzi and Education. Based on information from 'Pestalozzi goes Internet*'. Brühlmeier (2) and Silber. Pestalozzi world. Learning with head, heart and hand. This document has been prepared for non-commercial. educational purposes. by Pestalozzi World www.jhpestalozzi.org

Rajawat, D., & Patel, R. C. (2015). *Identifying the Tenets for Socio-Emotional Learning (SEL) & Development of Preschoolers*. IÈR. Journal of Research & Method in Education. 5(5):25-38. e-ISSN: 2320–7388. p-ISSN:2320–737X.

Schultz, M. L. (2017). *Pestalozzi's Mark on Nineteenth-Century Composition Instruction: Ideas Not in Words, but in Things*. Rhetoric Review. 14 (1): 23-43. 1995. https://www.jstor.org/ stable/46 5 659. (Erişim Tarihi: 15.07.2017).

Sinclair, P. (2014). *Whether Education is Natural or Social Process? Basics in Education* Textbook for B. Ed. Course.